# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven

FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 12
NUMBER 07

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

NOVEMBER 10, 2009 නොවැම්බර් මාසය (බුද්ධ වර්ෂ 2553 ඉල් මාසය) http://www.lankaheritage.com/lankaviththi/




## රණවිරුවන් සිහිකරන පොපි මල



*Photograph* - රවින්ද්‍ර සෙනෙවිරත්න Ravindra Seneviratne - *Sri Lanka*

*සෑම වසරකම පොපි දිනය සැමරීම සඳහා අවශ්‍ය පොපි මල් ශ්‍රීලංකාවට ලැබෙන්නේ (පරිත්‍යාගයක් ලෙස) එංගලන්තයෙනි. මෙම පොපි මල්වලින් මෝටර් රථ සඳහා පොපි මල්වඩම් නිපදවනු ලබන්නේ ශ්‍රීලංකාවේ ආබාධිත යුද සෙබළුන් හා සේවා මුක්ත යුද සෙබළියන් විසිනි. ජායාරූපයේ දැක්වෙන්නේ එක් විශ්‍රාමික සෙබළ කාන්තාවක් තම යෙහෙළියක් ද සමග සිය නිවසේ සිට පොපි මල්වඩම් තනන ආකාරයයි.*

උවදුරු සතුරු යළි මතු දින එන දාට
රණවිරු නොමැති දුක අපි කියමුද කාට?
තහවුරු කෙරෙන බුහුමන් එම විරු වාට
නිරතුරු ලොව පිපේ පොපි මල් රතු පාට

**If those brutal enemies raised head once more**
**Who would protect us sans heroes of the war?**
**In glorifying those absent lads with due care**
**Millions of red poppies are in bloom everywhere !**

♦ *දයා ආනන්ද රණසිංහ* ♦ *Daya Ananda Ranasinghe*

***Every year, to commemorate the Poppy Day, Sri Lanka gets poppies from England as a gift. These poppies are then used to make wreaths for motor cars by the disabled Sri Lankan soldiers and ex-women soldiers.***

***The picture here shows a retired Sri Lankan woman soldier carefully arranging a poppy wreath at home.***

# පරෙවියා ඉගිලුනොත්?

♦ *සංජය විමලරත්න විසිනි*



**මැ**යි මාසයේ යුද ජයග්‍රහණයෙන් පසුව මුළු මහත් රටෙහි ජනතාව ඉදිරිය පිළිබඳ ඉමහත් බලාපොරොත්තු ඇතිකරගෙන සිටියහ. එම ජයග්‍රහණය දේශද්‍රෝහී අතලොස්සක් හැර මුළු රටම එකට පෙළ ගැසී එකාමෙන් සිටීමේ ප්‍රතිඵලයක් බව කවුරුත් දනිති. මේ ජනතා අපේක්ෂාවන් සංකේත වත් කරන රූපයක් ගිය මාසයේ (ඔක්තෝබර්) අප පුවත් පතේ මුල් පිටුවේ පළකර තිබුණි. ඉතා පරෙස්සමෙන් දෝතට ගෙන සිටින සුදු පරෙවියෙකුගේ රූපය යටින් ලියූ කවි දෙකක් ද විය. අනේක ජීවිත පරිත්‍යාගයෙන් ලත් මෙම අනගි අවස්ථාව, සාමය හා සැනසීම රැකගනු වෙනුවට අප රට සිහිමඳ ලෙස කටයුතු කළහොත් ඒ සුදු පරෙවියා යළි නොඑන්නටම ඉගිලී යනු ඇතැයි යන අනතුරු ඇඟවීමද ඒ කවිවල ගැප්ව තිබුණේය.

බලාපොරොත්තු වූ පරිදි රට ඉදිරියට ගමන්කෙරෙන සමහර කටයුතු වේගයෙන් ඇර ඹිණ. පළමුවෙන්ම යුද්ධයේ ප්‍රතිඵලයක් වශයෙන් අවතැන් වූවන්ගේ කඳවුරුවල කටයුතු පිටස්තර කුමන බලවේග කුමක් කීවද පිළිවෙලකට කෙරිණ. දැන් ක්‍රමයෙන් අවතැන්වූවන් සිය ගම් ප්‍රදේශවල පදිංචි කරවීම අරඹා ඇත. යුද්ධයෙන් බැට කා විනාශ මුඛයට ගොස් තිබුණු උතුරුකරයේ වැඩ ද අපේක්ෂා කළ අකාරයට කෙරීගෙන යන ලකුණුද පෙනේ. මෙවන් දේ සියයට සීයක් තිතටම කිරීම අපහසු බව අපි දනිමු. නමුත් බාහිර තර්ජන ගර්ජන මැඩපවත්වාගෙන ඒවා කෙරෙන සැටි පෙනේ. ආර්ථික ඉදිරි ගමන්ද බොහෝය. විදේශික ආයෝජකයින් ලබාගැනීමට හා මහා කලබැගෑනියක්ව පැවති මූල්‍ය අරමුදලේ ණය මුදල් සංවර්ධනය සඳහා ලබාගැනීමටද රජයට හැකිවිය. එසේම මංමාවත්, වරාය, ජලය, විදුලිය ආදී යටිතල පහසුකම් සැලසීම ද වේගයෙන් සිදුවෙයි.

නමුත් මෑතක සිට රට යම් දේශපාලනමය සහ සමාජමය කැළඹීම් වලටද නැඹුරුවෙමින් පවතින බවක්ද පසුගිය සමයේ පෙනිණ. තවම යුද ජයග්‍රහණයෙන් හයමාසයක් වත් ගතවූයේ නැත. නමුත් බොහෝ අයට එයට පෙර විඳි දුක් හිරිහැර අතුරු ආන්තරා ව්‍යසන දැනටම අමතක වූ සෙයකි. ටික කලක් ඔළුව සඟවා ගෙන සිටි දේශද්‍රෝහී, අවස්ථාවාදී, දේශපාලන හා සමාජීය බලවේග එවැනිම සමහර මාධ්‍යකාරයින්ද අල්ලාගෙන පසුගිය කාලයේ දශක දෙක තුනක් කළ ආකාරයටම රට තුළ දැන් කැළඹීලි ඇති කරලීම පටන්ගෙන ඇති බව පෙනේ. පරෙවියා ඉගිලුනොත් යන මාතෘකා වෙන් මේ අනතුරු ඇඟවීම කරන් නට අප සිතුවේ මේ නිසාය.

### දකුණේ ඡන්දය සහ ඉන් පෙනුණු දේ

යුද්ධය අවසන් වූ වහාම වාගේ පැවැත්වුණු ඌව පළාත් සභා ඡන්දයේදී හැලහැප්පිලි ප්‍රශ්න ආදිය එපමණ මතු නොවිණ. යුද්ධ උණුසුම පිටම රට සහ ජනතාව පෙළගැසී ස්ථාවරයක සිටි බැවින්ද, සතුරු බලවේග එළියට ඒමට බියවූ බැවින්ද විය හැකිය.

නමුත් ඊයේ පෙරේදා පැවති දකුණු පළාත් සභා ඡන්දයෙන් හැල හැප්පිලි කැළඹීම් රාශයක් මතුවිය. රටේ බලයේ සිටින එක්සත් ප්‍රගති ශීලී පෙරමුණේ UPFA හි ප්‍රධාන පක්ෂය වන ශ්‍රීලංනිප හි පැවති ඌනතා එම ඡන්දය සඳහා අපේක්ෂ කයින් පත්කරලීමේ අවස්ථාවේ සිට ම මතුවිණ. ප්‍රධානතම දුර්වලතාව ලෙස පෙනුණේ පක්ෂ සංවිධාන කට යුතු කලක් අතපසුවී තිබීමය. පක්ෂයේ ඉහළ තැන්වල සිටින මැති ඇමතිවරුන්ට යුද්ධ කටයුතු ආදිය නිසා දේශපාලන සංවිධාන කටයුතු අමතකවී තිබිණ. කුමක් නිසා හෝ මේ දුර්වලකම් කැපී පෙනුණි. සමහර තැන්වල දාමරිකකම් ද දැතින්ම වෙඩිතබන්නට හැකියයි ත්‍රාස හා ත්‍රාඩ වහසි බස් දෙඩූවන් ද ඉදිරියට ආහ. තවත් තැනක ඉහළම තැන්වල උවමනාවන් උඩ පුතුන්, ඥාතීන්, හිතවතුන්, සිනමා නිළියන් ආදීන් පැරවුට් කරනු ලැබිණ. මේවා නිසා සැමදා පක්ෂයට ආදරයෙන් වෙහෙස මහන්සිවූ අවංක පාක්ෂි කයින් කළකිරුණු බව සැක නැත. මේ වන විට ඔළුව එළියට දමා

4 වන පිටුව බලන්න ➛




ඔබේ මුදල් අදම යවන්න අදම ලබාගන්න

FAST CASH
SEND TODAY - COLLECT TODAY

විස්තර පිටු අංක 3